## 5–15

### මොඝරාජ සුත්තං

1121. ද්වාහං සක්ක අපුච්ඡිස්සං (ඉච්චායස්මා මොඝරාජා)[1]
න මෙ ව්‍යාකාසි චක්ඛුමා,
යාවතතියඤ්ච දෙවීසි ව්‍යාකරොතීති මෙ සුතං.

1122. අයං ලොකො පරො ලොකො බ්‍රහ්මලොකො සදෙවකො,
දිට්ඨිං තෙ නාභිජානාති ගොතමස්ස යසස්සිනො.

1123. එතං අභික්කන්තදස්සාවිං අත්ථි පඤ්හෙන ආගමං,
කථං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති.

1124. සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු මොඝරාජ සදා සතො,
අත්තානුදිට්ඨිං ඌහච්ච එවං මච්චුතරො සියා;
එවං ලොකං අවෙක්ඛ'න්තං මච්චුරාජා න පස්සතීති.

මොඝරාජසුත්තං පණ්ණරසමං[2].

## 5 – 16

### පිඞ්ගිය සුත්තං

1125. ජිණ්ණොහමස්මි අබලො වීතවණ්ණො (ඉච්චායස්මා පිඞ්ගියො)[3]
නෙත්තා න සුද්ධා සවනං න ඵාසු,
මාහං නස්සං මොමුහො අන්තරාව
ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං
ජාතිජරාය ඉධ විප්පහානං.

1126. දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ (පිඞ්ගියාති භගවා)
රුප්පන්ති රූපෙසු ජනා පමත්තා,
තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො
ජහස්සු රූපං අපුනබ්භවාය.

---

1. මොඝරාජ මාණව පුච්ඡා
2. මොඝරාජ මාණව පුච්ඡා–පණ්ණරසී–ම. ජ. ස.
3. පිඞ්ගියමාණව පුච්ඡා.



Free Distribution www.aathaapi.org

## 5 – 15

## මොසරාජ පෘච්ඡා

1121 (ආයුෂ්මත් මොසරාජ මෙසේ ඇසිය:) මම දෙවටක් ශාක්‍ය මුනිහු විචාළෙමි, පසැය් ඇති මුනිහු මට නො දෙසූහ. දෙවර්ෂිහු තෙවනුවට දක්වා විචාරණ ලද්දහු ප්‍රකාශ කරන්නාහ''යි මා විසින් අසන ලද.

1122 මෙ මිනිස්ලෝ වැසි තෙමේ ද, අන්ලෝ වැසි තෙමේ ද දෙවියන් සහිත බඹලො වැසි තෙමේ ද යශස්වී වූ ගෞතම ගොත්‍ර ඇති මුඹ වහන්සේගේ දෘෂ්ටිය නොදක්නේ ය.

1123 මෙසේ පරමදර්ශී වූ සර්වඥයන් වහන්සේ කරා පැන පුළුවුස්නෙන් අර්ථී ව ආයෙමි. ලොව කිසෙයින් බලන්නහු මෘත්‍යුරාජ තෙමේ නො දක්නේ ද?

1124 මොසරාජය හැමකල්හි ස්මෘතිමත් වැ සත්කාය දෘෂ්ටිය දුරු කොට ලෝකය ශූන්‍ය හෙයින් බලව, මෙ සෙයින් මෘත්‍යුහු ඉක්මවන්නෙහි මෙසෙයින් ලොව දක්නහු මෘත්‍යුරාජ තෙම නොදක්නේ යයි,

**මොසරාජ මාණව පෘච්ඡා නිමි.**

## 5 – 16

## පිඞගියමාණව පෘච්ඡා

1125 (ආයුෂ්මත් පිඞගිය මෙසේ විචාරයි) මම ජීර්ණයෙමි, දුර්වලයෙමි, විවර්ණයෙමි, (මාගේ) නේත්‍රයෝ ශුද්ධ නො වෙති, ශ්‍රවණය ද පහසු නැත, මම (මුඹ වහන්සේගේ දහම් පසක් නොකොට) අතුරෙහි මැ මුළා වූ යෙම් නහමක් මියෙම්වා. මේ පහණසැවෙහෙරෙහි මැ ජාති ජරාවන්ගේ ප්‍රහාණය වූ යම් දහමක් අසා මම දැනගන්නෙම් නම්, එ දහම වදළ මැනැව.

1126 (බුදුහු මෙසේ වදළහ: පිඞගියෙනි,) රූප නිමිතින් නැසෙන වුන් දැක (කුශලධර්මයන්හි) ප්‍රමත්ත වූ ජනයෝ රූපයන් නිමිති කොට පෙළෙති. පිඞගිය, තෙපි (කුශලධර්මයෙහි) අප්‍රමත්තව පුනර්භවය නො වනු පිණිස රූපය දුරු කරව.